සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **පෙරදිග සංගීතය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 40 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගායනයට සුදුසු, කල්‍යාණ මේලගත රාග යුගලය කුමක් ද?
    (1) යමන් - භූපාලි (2) යමන් - බිලාවල් (3) බිලාවල් - භූපාලි (4) යමන් - කාෆි

02. ''නි̣රිස, නි̣රිගරිස .......'' යමන් රාගයට අදාළව මෙම ස්වර අභ්‍යාසයේ ඊළඟ යෙදෙන පියවර වන්නේ කුමක් ද?
    (1) නි̣රිගමගරිස (2) නි̣රිගම́ගරිස (3) නි̣රිගපගරිස (4 නි̣රිගම́පම́රිස

03. නිර්දේශිත රාග අතරින් ඖඩව ජාති රාගය කුමක් ද?
    (1) භෛරවී (2) යමන් (3) කාෆි (4) භූපාලි

04. | ම ග රි | ස රි නි̣ | ස - ධ̣ | නි̣ ස -| මෙම සර්ගම් පාදය, භෛරවී රාගයට අදාළව නිවැරදිව ලියා දැක්වීමට නම්.
    (1) රි, ධ ස්වර පමණක් කෝමල විය යුතු ය. (2) ග, නි ස්වර පමණක් කෝමල විය යුතුය.
    (3) රි, ග, ධ, නි ස්වර පමණක් කෝමල විය යුතු ය. (4) ග, ධ, නි ස්වර පමණක් කෝමල විය යුතුය.

05. "ම" ස්වරය (මධ්‍යමය) සම්බන්ධව දී ඇති වැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) යමන් රාගයේදී තීව්‍රව යෙදේ (2) භූපාලි රාගයේ වර්ජිත වේ.
    (3) කාෆි රාගයේ සංවාදී ස්වරය වේ. (4) භෛරවී රාගයේ වාදී ස්වරය වේ.

06. තබ්ලාවේ බායාං කොටසින් පමණක් උපදවාගත හැකි අක්ෂර ඇතුළත් පිළිතුර කුමක් ද?
    (1) ගෙ, කි, කත් (2) ත, ක, තිං (3) ධ, ධි, ධිං (4) ගි, කත්, ති

07. ජප් තාලයට සමානව මාත්‍රා බෙදෙන දේශීය තිත් රූපය වන්නේ,
    (1) සුළු තනි තිත ය. (2) සුළු මැදුම් දෙතිත ය.
    (3) මැදුම් මහ දෙතිත ය. (4) මහ තනි තිත ය.

08. කෙහෙර්වා තාලය ආවර්ත දෙකක් වාදනය කිරීමේදී ලැබෙන මාත්‍රා සංඛ්‍යාවට සමාන මාත්‍රා සංඛ්‍යාවක් සහිත නිර්දේශිත තාලය කුමක් ද?
    (1) ලාවනී (2) දීප්චන්දි (3) ත්‍රී තාලය (4) දාදරා

09. [[ ස රි ග | ස - - ]] මෙලෙස ස්වර ලිපියක සංකේතයක් යොදා ඇත්නම් ඉන් අදහස් වන්නේ,
    (1) පෙර විභාගයේ ස්වර නැවත වාදනය කළ යුතුය යන්න ය.
    (2) පෙර විභාග දෙකේ ස්වර නැවත වාදනය කළ යුතුය යන්න ය.
    (3) මෙම ස්වර ඛණ්ඩය දෙවරක් වාදනය කළ යුතුය යන්න ය.
    (4) ප්‍රස්තාරයේ මුලින් යෙදූ සංකේතය වෙත යා යුතුය යන්න ය.

10. ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය නම් ග්‍රන්ථය රචනා කළ සංගීතඥයා කවුරුන් ද?
    (1) ඩබ්. බී. මකුලොලුව මහතා (2) සී. ද එස්. කුලතිලක මහතා
    (3) රෝහණ බැද්දගේ මහතා (4) ආනන්ද සමරකෝන් මහතා

11. මනමේ සහ දික්තල කාලගෝල යන නාට්‍ය සඳහා ආභාසය කරගත් රංග සම්ප්‍රදාය වන්නේ කුමක් ද?
(1) නූර්ති (2) නාඩගම් (3) සොකරි (4) කෝලම්

12. ශ්‍රී ලංකා ගුවන් විදුලියේ පටිගත කළ මුල්ම සරල ගීතය ලෙස සැලකෙන්නේ,
(1) දියගොඩ සැමතැන ගීතය යි. (2) බැස සීතල ගඟුලේ ගීතය යි.
(3) ඕලු පිපිලා විල ලෙල දෙනවා ගීතය යි. (4) දුර පෙනෙන තැනිතලා ගීතය යි.

- අංක 13 සිට 17 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත වගුව උපයෝගී කරගන්න.

| | |
|---|---|
| A | කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා<br>මලේ මලේ අර නා මල නෙලා වරෙන් |
| B | ඕලු පිපිලා විල ලෙල දෙනවා<br>අක්කෙ අක්කෙ අර බලන්නකෝ |
| C | පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට<br>සුරරද සමන් සමගින් සුරඟන එවර |
| D | දැඩිකළ මාතා පෙම්බර මාතා<br>සිරි බුද්ධගයා විහාරේ |

13. A අක්ෂරයට අදාළ ගීත විශේෂය සම්බන්ධව ලියා ඇති නිවැරදි පිළිතුර කුමක් ද?
(1) ආඝාතාත්මක ගීත වේ. (2) අනාඝාතාත්මක ගීත වේ.
(3) සරල ගීත වේ. (4) නාට්‍ය ගී වේ.

14. ග්‍රැමෆෝන් ගීත ඇතුළත් අක්ෂරය වන්නේ කුමක් ද?
(1) A (2) B (3) C (4) D

15. A සහ C අක්ෂරයන්ට අදාළ ගීත, ජන ගී වර්ගීකරණයේදී පිළිවෙලින් හඳුන්වන්නේ,
(1) ගැමි ගී - සේ ගී ලෙස ය.
(2) බැති ගී - කෙළි ගී ලෙස ය.
(3) ගැමි ගී - යාග ගී ලෙස ය.
(4) තුණ්සරණේ ගී - දරු නැලවිලි ගී ලෙස ය.

16. C අක්ෂරයට අදාළ ගීත සම්බන්ධව ඇති නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ගුත්තිල කාව්‍ය ය - දොලොස්මත් පැදි
(2) ගුත්තිල කාව්‍ය - සමුද්‍රඝෝෂ විරිත
(3) සැළලිහිණි සන්දේශය - අටවිසිමත් පැදි
(4) සැළලිහිණි සන්දේශය - සමුද්‍රඝෝෂ විරිත

17. B තීරුවේ සඳහන් ගීත ගායනා කළ ශිල්පීන් දෙපල වන්නේ,
(1) ඩබ්. ඩී. අමරදේව මහතා සහ එච්. ඩබ්. රූපසිංහ මහතා ය.
(2) සුනිල් ශාන්ත මහතා සහ ආර්. මුත්තුසාමි මහතා ය.
(3) ආනන්ද සමරකෝන් මහතා සහ ඩබ්. ඩී. අමරදේව මහතා ය.
(4) සුනිල් ශාන්ත මහතා සහ ආනන්ද සමරකෝන් මහතා ය.

18. ගීත ගායනයත් සමගම ආඝාතය තැබීම හඳුන්වන්නේ,
(1) සමග්‍රහ නිමිනි. (2) අවග්‍රහ නිමිනි. (3) විෂමග්‍රහ නිමිනි. (4) ග්‍රහ නිමිනි.

19. ජිං / ජිමිකිට / තත් / කිටිතක / මෙම බෙරපදය වාදනය කරනු ලබන භාණ්ඩය කුමක් ද?
(1) ගැට බෙරය (2) යක් බෙරය (3) දවුල (4) තම්මැට්ටම

20. දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණය යටතේ විතත ඝනයට අයත් භාණ්ඩය කුමක් ද?
(1) දවුල (2) තම්මැට්ටම (3) රබාන (4) බුම්මැඩිය

21. F Major Scale වාදනයේදී ලැබෙන විකෘති ස්වරය වන්නේ කුමක් ද?

(1) $B^b$ (2) $A^b$ (3) $E^b$ (4) $D^b$

22. ''බුද්ධං සරණං සිරස දරාගෙන'' මෙම ගී පාදයේ ඇති සඳැස්මත් හා ගීමත් ගණන පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) 14 - 16 (2) 16 - 22 (3) 16 - 24 (4) 16 - 20

23. ශ්‍රී ලංකා ගුවන් විදුලිය ආශ්‍රිතව ගොඩනැගුණ කණ්ඩායම් ගීත නිර්මාණ තුළ "වාග්ගේයකාර" ලෙස හඳුන්වනු ලබන ශිල්පියා කවුද?

(1) නෙවිල් ප්‍රනාන්දු (2) නොයෙල් රණසිංහ
(3) මොරිස් දහනායක (4) ක්ලැරන්ස් විජේවර්ධන

24. ස්වර සප්තකයක් තුළ ඇති ප්‍රකෘති හා විකෘති ස්වර සංඛ්‍යාව පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) 5 - 7 (2) 7 - 5 (3) 12 - 7 (4) 7 - 12

25. ලයෙහි ප්‍රභේද තුන සඳහන් නිවැරදි පිළිතුර වන්නේ,

(1) මන්ද්‍ර, මධ්‍ය, උච්ච (2) විලම්භ, මධ්‍ය, ධ්‍රැත
(3) ශබ්ද, නාද, හඬ (4) ශුද්ධ, කෝමල, තීව්‍ර

- අංක 26 සිට 28 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු උපයෝගී කරගන්න.

A - සබේ විදානේ විසින් චරිත හඳුන්වා දෙයි

B - හින්දුස්ථානි රාගධාරී සංගීතයේ ආභාසය ඇත.

C - සියලුම චරිත වර්ණවත් වෙස්මුහුණු පළඳී

D - මද්දලය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩයයි.

E - දොහොරාව නමින් විශේෂිත ගායනා කොටසක් ඇත.

26. කෝලම් රංග සම්ප්‍රදායට අදාල කරුණු ඇතුළත් ඉංග්‍රීසි අක්ෂර මොනවා ද?

(1) A, B (2) B, C (3) A, C (4) B, E

27. නූර්ති රංග සම්ප්‍රදායට අයත් තොරතුරු ඇතුළත් ඉංග්‍රීසි අක්ෂර වන්නේ,

(1) A, B (2) B, C (3) B, D (4) B, E

28. D අක්ෂරයට අදාල තොරතුරු ඇතුලත් රංග සම්ප්‍රදාය කුමක් ද?

(1) සොකරි (2) කෝලම් (3) නූර්ති (4) නාඩගම්

29. 1505 වර්ෂයේ පෘතුගීසින්ගේ පැමිණීමෙන් පසුව ලංකාවට ලැබුණු සංගීත ශෛලිය කුමක් ද?

(1) කපිරිඤ්ඤා (2) විරිඳු (3) ග්‍රැමෆෝන් (4) නූර්ති

30. උකුසා වන්නමේ නාදමාලාව ආශ්‍රිතව නිර්මාණය වී ඇති සරල ගීතය කුමක් ද?

(1) රුක් අත්තන මල මුදුනේ (2) මල්සරා බැල්ම හෙලා
(3) ගම අවුලඤ්ඤං (4) ආදරයේ උල්පත වූ අම්මා

31. උතුරු ඉන්දියාවේ දෙවියන් උදෙසා ගායනා කළ භක්ති රසයෙන් යුක්ත ගායනා විශේෂය කුමක් ද?

(1) තරානා (2) භජන් (3) ඛ්‍යාල් (4) ගසල්

32. මහනුවර යුගයේ කවිකාර මඩුවේ ගායනය කරනු ලැබූ මුද්‍රපදය සහිත ගීත විශේෂය වන්නේ කුමක් ද?

(1) වන්නම් (2) ප්‍රශස්ති (3) හටන් (4) සංදේශ කාව්‍ය

33. G minor chord (ජී මයිනර් කෝඩ්) එකට අදාළ ස්වර වන්නේ,

(1) ස ග ප (2) ස ග̲ ප (3) ප නි රි̇ (4) ප නි̲ රි̇

34. ස්වර පිහිටීම අතින් සමාන සංගීත භාණ්ඩ යුගලයකි.

(1) වයලීනය - එස්රාජය (2) එස්රාජය - සිතාරය

(3) සිතාරය - ගිටාරය (4) වයලීනය - ගිටාරය

35. බටහිර සංගීත ප්‍රස්තාරකරණයේදී ''විරාම'' දැක්වීම සඳහා යොදාගනු ලබන සංකේත හඳුන්වන නම කුමක් ද?

(1) Bind Marks (2) Repeat Marks

(3) Tie Mark (4) Rest marks

36. යතිය සහිත ගී පාදයක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) අර බලන්න ඉර ගිරවිගෙ පැටියෝ (2) උදයට පායන හිරු දෙවියන්ටයි.

(3) සඳවා සුදු වැලි පිවිතුරු (4) අහසට පිඹිනා එරන් කලේයා

37. විදුලි ඕගනයක ලය නැතහොත් වේගය සකස්කර ගැනීමට යොදා ගන්නා ස්විචය වන්නේ මින් කුමක් ද?

(1) BEAT (2) SONG (3) TONE (4) TEMPO

38. රබින්ද්‍ර සංගීතයේ යොදා ගන්නා තාල වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(1) උඩැක්කිය (2) කෝල් බෙරය (3) රබාන (4) ටැම්බරින්

39. දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණයේ කොටස් ගණන කීය ද?

(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි.

40. සරල ගීතයක දක්නට ඇති ආකෘතිය පිළිවෙලින් සඳහන්ව ඇති වරණය තෝරන්න.

(1) CHORUS, VERSE, INTRO, INTER

(2) CHORUS, VERSE, INTER, INTRO

(3) INTRO, CHORUS, INTER, VERSE

(4) INTRO, VERSE, INTER, CHORUS

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**10 ශ්‍රේණිය**

# පෙරදිග සංගීතය - II

කාලය පැය 02 යි.
අමතර කාලය මිනිත්තු 10

නම/ විභාග අංකයඃ

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) (i) නිර්දේශිත රාග අතරින් විවාදි ස්වර පහක් යෙදාගත හැකි රාගය නම් කරන්න. (ලකුණු 01)

(ii) ඖඩව - ෂාඩව යනුවෙන් යෙදෙන රාග ජාතියෙහි, ආරෝහණ අවරෝහණ ස්වර සංඛ්‍යාව පිළිවෙලින් ලියන්න. (ලකුණු 01)

(iii) සරිස, සරිගරිස, ....... මෙම ස්වර අභ්‍යාසය භූපාලි රාගයට අනුව ගොඩනැගීමේ දී ඊළඟට යෙදෙන පියවර දෙක ලියන්න.(ලකුණු 02)

(iv) /රි - ග ම / රි - ග ම / රි - ග ම / ප - - - / මෙම ප්‍රස්තාරයේ දෙවන හා තෙවන විභාග සඳහා යෙදීමට සුදුසු Repitation Mark යොදා නැවත ලියා දක්වන්න. (ලකුණු 01)

(v) "පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට" මෙම ගී පාදය අයත් වන්නේ කුමන සංදේශ කාව්‍යයට ද? (ලකුණු 01)

(vi) "හෙළ ගී මග" නම් කෘතියෙහි නිර්මාතෘ කවුරුන් ද? (ලකුණු 01)

(vii) කායදා, පල්ටා, මුඛඩා ආදී වාදන අංග වැයීමට සුදුසු වාද්‍ය භාණ්ඩය කුමක් ද? (ලකුණු 01)

(viii) සාමූහිකව ගායනය **නොකරන** මෙහෙ ගී වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ix) ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවය ආරම්භ කළ වර්ෂය කුමක් ද? (ලකුණු 01)

(x) "ම" වාදී "ස" සංවාදී වන නිර්දේශිත රාගයෙහි අනුවාදී ස්වර ලියා දක්වන්න. (ලකුණු 01)

(02) පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග හතරක සර්ගම් ගී පාද කීපයකි.

(A) නි ධ - ප | ම´ ප ග ම´ | ප - - - | ප ම´ ග රි

(B) ස̇ ස̇ ධ ප | ග රි ස රි | ග - ප ග | ධ ප ග

(C) ස ධ̲ ප ධ̲ | ම ප ග̲ ම | නි̲ ධ̲ - ස | - රි̲ ග̲ ම

(D) ග ප ධ නි | ස̇ - ධ ප | ම ග ම රි | ස රි ස -

(i) ඉහත දැක්වෙන සර්ගම් ගී පාද අයත් වන රාගවල නම් ඉංග්‍රීසි අක්ෂරය සමග ලියා දක්වන්න. (ලකුණු 04)

(ii) ඉහත A හා C අක්ෂරවලට අයත් රාග අතරින් එක් රාගයක මධ්‍යලය ගීතයේ / වාදිතයේ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iii) ඉහත රාග අතරින් රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයෙන ඖඩව - ජාති රාගයේ මේලය, ආරෝහණ, වාදී, සංවාදී ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

(03) (i) පහත සඳහන් අසම්පූර්ණ රාග විස්තර වගුව ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන හිස් තැන් සම්පූර්ණ කරන්න.

| තාලය | මාත්‍රා | විභාග | තාල සංඥා | ඨේකාව | ගී පාදයක් | දේශීය තාලය | බටහිර තාලරූප |
|---|---|---|---|---|---|---|---|
| - | - | 4 | × 2 0 3 | - | - | මහ තනි තිත | $\frac{4}{4}$ |
| කෙහේරවා | 8 | 2 | - | - | දිය ගොඩ සැම තැන කිරි ඉතිරේ | - | - |
| ජප් | 10 | - | × 2 0 3 | - | ඔබයි රම්‍ය සඳ කිරණ ඝන අන්ධකාරේ | - | - |
| - | - | 4 | × 2 0 3 | - | - | මැදුම් මහ දෙතිත | $\frac{7}{4}$ |

(½බැගින් ලකුණු 08යි.)

(ii) මාත්‍රා 6 ක හින්දුස්ථානී තාලය නම්කර, නියමිත තාල සංඥා සමගින් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

(04) (i) තබ්ලාවේ දායාං කොටසේ මුහුණතක් ඇඳ පහත දැක්වෙන කොටස් නම් කරන්න. (ලකුණු 04)
(ලවය, චාන්ටි, සියාහි, ගජරා)

(ii) එහි පහත දැක්වෙන අක්ෂර වාදනය වන ස්ථානය නම් කරන්න. (ලකුණු 04)
නා, තිං, ට, ගෙ (ලකුණු 04)

(iii) විෂය නිර්දේශයට අනුව තෝරාගත් ස්වර වාද්‍ය භාණ්ඩයක (යතුරු පුවරුව හැර) දළ රූප සටහනක් ඇඳ කොටස් හයක් ලකුණු කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

(05) (i) පහත දැක්වෙන ගී පාද අයත් ගැමි ගී වර්ගය ඊට අයත් ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ලියන්න.

(A) වෙල්යායක ගොන් දෙන්නෙක් කකා උනී.
(B) දොඩම් කපාලා ඇඹුල් තනාලා
(C) ඉන්නෙත් දුම්බරයි මහ කළු ගලක් යට
(D) උදයට පායන හිරු දෙවියන්ටයි. (ලකුණු 2 )

(ii) B අක්ෂරයට අයත් ගී පාදය ගැයීමට උචිත තිත් රූපය නම්කර ඊට අයත් උඩරට බෙර පදය නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

(iii) ඉහත ගී පාද උදාහරණ කර ගනිමින් ආඝාතාත්මක හා අනාඝාතාත්මක පැදි යනු විස්තර කරන්න. (ලකුණු 4)

(මුළු ලකුණු 12)

(06) පහත දී ඇති මධ්‍යමය ශ්‍රැති ස්වරය කරගත් බටහිර ස්වර ප්‍රස්තාරය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ඉහත දැක්වෙන බටහිර ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට හරවා නැවත ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

(ii) A, B, C, D සංකේත නම් කරන්න. (ලකුණු 02)

(iii) ඉහත ප්‍රස්තාරයේ මුල් විභාග හතර පංචම භාවයෙන් ලියා දක්වන්න. (ලකුණු 04)

(07) පහත දැක්වෙන මාතෘකා අතරින් **එකක්** පිළිබඳව සුවිශේෂී කරුණු හතරක් ඇතුළත් කරමින් කෙටියෙන් විස්තර කරන්න.

(අ) ග්‍රැමෆෝන් සංගීතය.
(ආ) ජන ගී වර්ගීකරණය.
(ඇ) ශ්‍රී ලංකා ගුවන් විදුලිය.
(ඈ) ජන සංගීතයේ උන්නතියට කටයුතු කළ දේශීය සංගීතඥයෝ
(ඉ) නූතන තාක්ෂණ මෙවලම් මගින් සංගීත නිර්මාණකරණය (මුළු ලකුණු 12)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(2) | 3 -(4) | 4 -(3) | 5 -(3) | 6 -(1) | 7 -(2) | 8 -(3) | 9 -(1) | 10 -(2) |
| 11-(2) | 12 -(3) | 13 -(2) | 14 -(4) | 15 -(1) | 16 -(4) | 17 -(4) | 18 -(1) | 19 -(3) | 20 -(2) |
| 21-(1) | 22 -(3) | 23 -(4) | 24 -(2) | 25 -(2) | 26 -(3) | 27 -(4) | 28 -(4) | 29 -(1) | 30 -(1) |
| 31-(2) | 32 -(2) | 33 -(4) | 34 -(2) | 35 -(4) | 36 -(3) | 37 -(4) | 38 -(2) | 39 -(4) | 40 -(3) |

(එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් හිමිවේ.)

## II පත්‍රය

(01) (i) භෛරවී රාගය (ල.01) (ii) 5 - 6 (ල.01) (iii) සරිගප ගරිස සරිගපධපගරිස (ල.01)

(iv) /රි - ග ම /Ô / Ô / ප - - - / හෝ [[[රි - ග ම]]] ප - - - / (ල.01) (v) සැළලිහිනි සංදේශය (ල.01)

(vi) ඩබ්. බී. මකුලොලුව මහතා (ල.01) (vii) තබ්ලාව (ල.01) (viii) ගැල්, පැල්, පාරු, පතල්, බඹර (ල.02)

(ix) 1925 (ල.01) (x) රි ග ප ධ නි (ල.01) (ල.01) (ල. 12)

(02) (i) A - යමන් රාගය, B - භූපාලි රාගය, C - භෛරවී රාගය, D - බිලාවල් රාගය (ල. 04)

(ii) මධ්‍යලය ස්ථායි කොටස නිවැරදිව ස්වර ප්‍රස්තාර කර ඇත්නම් (ල.04)

(iii) භූපාලි රාග විස්තරය කොටසට (ල. 04)

(03) (i) හිස්තැනකට ලකුණු ½ බැගින් ලකුණු 08.

(ii) දාදරා තාලය - ප්‍රස්තාර කිරීමට ලකුණු 04 (නම් කිරීමට 1, තාල සහ ගායනය 1, යේබාව 2) (මුළු ලකුණු 12)

(04) (i) තබ්ලාවෙහි දායාං කොටසේ අදාළ කොටස් හතරක් නම් කිරීමට (ල. 04)

(ii) නා, තා = චාන්ටි තිං = ලවය ට = සියාහි ගෙ = මෛදානි (ල. 04)

(iii) ස්වර වාද්‍ය භාණ්ඩයක දළ රූප සටහනට ල. 01 කොටස් 6ක් සඳහා ½ × 6 = 3 (මුළු ලකුණු 12)

(05) (i) A - පැල් ගී B - ඔළිඳ කෙළිය C - පතල් ගී D - ගොයම් ගී (ල. 2 )

(ii) තිත නම්කර නියමිත තිත් සංඥා යොදා බෙරපදය ප්‍රස්තාර කිරීමට (ලකුණු 6)

(iii) ආඝාතාත්මක අනාඝාතාත්මක පැදි නිදසුන් සහිත ව විස්තර කිරීමට. (ලකුණු 4) (මුළු ලකුණු 12)

(06) (i) + ස නි | ස ග ම | - ප ධ | නි - - | සं නිධ නි | ධ සं - (ල. 06)

(ii) A Key Signature B Time Signature

C Crotchet Rest Mark D Tie Mark (ල. ½ × 4 = 2

(iii) පංචම භාවයෙන් ලිවීමට (ල. 04)

/+ රි ස / රි ම් ප / - ධ නි / සं - -/

(07) තෝරාගත් එක් මාතෘකාවකට අදාලව සුවිශේෂී කරුණු හතරක් ඇතුළත් කර විස්තර කිරීමට ලකුණු 12 යි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

## 10 ශ්‍රේණිය පෙරදිග සංගීතය - ප්‍රයෝගික පරීක්ෂණය

| ප්‍රශ්න අංකය | | ප්‍රශ්න හා අපේක්ෂිත ප්‍රතිචාර | ලකුණු |
|---|---|---|---|
| 01 | 1. | පරීක්ෂක විසින් අක්ෂර භාවිතයෙන් ("අ", "ල" වැනි) ගයනු ලබන ස්වර හඳුනාගෙන නම් කිරීම. | 04 |
| | 2. | පරීක්ෂක විසින් ගයනු ලබන සරල ගීතය සඳහා වාදනයට සුදුසු හින්දුස්ථානි තාලය හඳුනාගෙන නම් කිරීම.<br>• ඉහත නම් කළ තාලයේ තාල පදය විභාග අනුව වෙන්කර ලිවීම.<br>• ඉහත තාලයට ගැලපෙන වෙනත් ගීතයක මුල් පාදයක් ලිවීම.<br>• ඉහත තාලයට සමාන දේශීය තිත නම් කිරීම. | 04 |
| | 3. | පරීක්ෂක විසින් ගයනු ලබන නිර්දේශිත රාගයකට අයත් ස්වර සංගතියක් හෝ දෙකක් ශ්‍රවණය කර, රාගය හඳුනාගෙන එම රාගය ආශ්‍රිතව අසනු ලබන ප්‍රශ්න හතරට පිළිතුරු සැපයීම.<br>• රාගයේ නම • අවරෝහණය • ආරෝහණය<br>• රාගයේ විශේෂ ලක්ෂණයක් | 04 |
| 02 | | භෛරවි, යමන් යන නිර්දේශිත රාග අතුරෙන් කැමති රාගයක ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගීතයක්/ වාදිතයක්, ගායනය/ වාදනය කිරීම.<br>(ආරෝහණ - අවරෝහණ, ස්ථායි, අන්තරා) | 20 |
| 03 | | නිර්දේශිත රාග දෙක අතුරෙන් පරීක්ෂක මණ්ඩලය විසින් නම් කරනු ලබන රාග දෙකෙන් කැමති එක් රාගයකට අයත් සර්ගම් ගීතයක් හෝ ලක්ෂණ ගීතයක් ගායනය/ වාදනය කිරීම සහ එම රාගයට අදාළව පරීක්ෂක විසින් ඉදිරිපත් කරන ස්වර ඛණ්ඩය ඒ ආකාරයෙන් ම ඔබ විසින් අනුකරණය කරමින් ගායනය/ වාදනය කිරීම.<br>**(ඉහත 02 ප්‍රශ්නය සඳහා ඉදිරිපත් කළ රාගය මෙහිදී නම් නොකෙරේ)** | 12 |
| 04 | | • සරල ගී හෝ චිත්‍රපටි ගීත(සිංහල/ හින්දි) • නාට්‍ය ගී හෝ ගීත නාට්‍ය ගී<br>• නූර්ති හෝ නාඩගම් ගීත • ග්‍රැමෆෝන් ගී හෝ කණ්ඩායම් ගී<br>ඉහත සඳහන් ගීත කාණ්ඩ අතුරින් තෝරාගත් කාණ්ඩයේ සඳහන් ගීත වර්ග දෙක අතුරින් එක් නිර්දේශිත ගීතයක් ගායනය/ වාදනය කිරීම.<br>(මෙහිදී අවශ්‍ය නම් ගායනය ප්‍රධානව තෝරාගත් අපේක්ෂකයින්ට වාදනයෙන් ද, වාදනය ප්‍රධානව තෝරාගත් අපේක්ෂකයින්ට ගායනයෙන් ද ඉදිරිපත් විය හැකි ය.) | 16 |
| 05 | 1 | නිර්දේශිත ගැමි ගීයක් ගායනය කිරීම, (ආසාතාත්මක හෝ අනාසාතාත්මක) | 08 |
| | 2 | වන්නම්/ප්‍රශස්ති/හටන්/ යන සෙ ගී අතුරරින් කැමති එක් වර්ගයකට අයත් ගීතයක් ගායනය | 08 |
| 06 | 1 | කැමති සංගීත භාණ්ඩයකින් (ස්වර පුවරුව හැර) ගීතයක් වාදනය කිරීම. හෝ කැමති සංගීත භාණ්ඩය ලෙස තබ්ලාව යොදා ගන්නේ නම්, නිර්දේශිත තාලයක ඨේඛාව සමග කායදාවක් සහ පල්ටාවක් වාදනය කිරීම. | 12 |
| | 2 | ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය කිරීම. | 12 |
| | | මුළු ලකුණු | 100 |